# උඩරට ප්‍රභූ පන්තියේ ජීවමාන උරුමය සංරක්ෂණය පිළිබඳව ඇහැළේපොළ වලව්ව ආශ්‍රිත විමර්ශනයක්

**ඒ. එම්. එම්. අබේකෝන්**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
mahishani1992@gmail.com

---

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව තුළ පුරාවස්තු විශාල ප්‍රමාණයක් පැවතිය ද එම පුරාවස්තූන් අතර වැඩි අවධානයක් යොමු නොවූ මුත් ඉතා වටිනා ගොඩනැගිලි විශේෂයක් ලෙස වලව් පෙන්වාදිය හැකි ය. වලව් අතරින් ඉන්දියාවේ මලබාර් කුමාරිකාවන්ට උචිත වන ආකාරයට නිර්මාණය කළ නිවාසවලට සමාන ඉදිකිරීමක් ලෙස මහනුවර යුගයේ අගභාගයට අයත් ඇහැළේපොළ වලව්ව පෙන්වාදිය හැකි ය. මහනුවර රාජධානියේ සෙසු වාස්තු විද්‍යාත්මක නිර්මාණයන්ට වඩා මෙම වලව් සඳහා උරුම කළමනාකරණය අවම වශයෙන් දායක කරගත්තේ ඇයි ද යන ගැටලුව ඇහැළේපොළ වලව්ව ඇසුරින් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එම උරුමය සමාජය සඳහා ප්‍රයෝජනවත් අයුරින් සකස් කිරීම සඳහා මෙහිදී යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද බලාපොරොත්තු වේ. එම පරිශ්‍රය ආශ්‍රය කරගනිමින් සැලසුම් ලබාගැනීමට හා ප්‍රශ්නාවලියක් සකස්කර තොරතුරු ලබාගැනීම මෙහි ක්‍රමවේදය වේ. මෙම පර්යේෂණය හරහා මහනුවර යුගයේ අනෙක් ස්මාරක කෙරෙහි දක්වන අවධානය වලව් සඳහා යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : ඇහැළේපොළ වලව්ව, මහනුවර යුගය, උරුම කළමනාකරණය